

# එදා අපේ ගම

යන්නට කලින් බක්මහ කිරිබතෙහි          රසේ
කුඹුරේ පුරන්හීයේ අඩ හැරය          ඇසේ
ගෙඩි එක දෙක ඉදී ගේ ළඟ ඇටඹ          ගසේ
අසිරිය ගැන කියයි ලඟ එන වෙසක්          මසේ

මෝරා ලපළු මල් පිබිදේ කිණිති          මත
බෝ තුරු ලතාවෝ හිස පල බරව          ඇත
හෝගා ගලන ඔය දැලම කරන          තෙත
සෝභාවික සිරිය ගමතුල ඉපිල          යත

නිරතුරු හඬ ඇසේ පොඩි ගව          පැටවුන්ගේ
සුමියුරු ගීත රාවය දෙයි          විහඟුන්ගේ
වනතුරු මල් රොනට එන වන          බමරුන්නේ
පසතුරු නදිනි ගමවෙත අරුණලු          එන්නේ

හේනේ ඉරිඟු කුරහන්වල සුවඳ          දැනී
රෑනේ එන ගිරව් තුරුහිස වැළඳ          ගනී
ආනේ ඉහල වක්කඩ ළඟ එකට          ගැනී
මානේ බලා කිරිකොක් රෑළ වෙළට          පනී

ඇඳගෙන රෙද්ද හැට්ටය ඇඟ පතට          නිසී
බැඳගෙන දිගටි කොණ්ඩය ගෙල මතට          රිසී
නැලවෙන උකුල සඳවත මල් සිනා          සිසී
කළගෙන සොඳුරු ලලනාවන් දියට          බසී

ගුරු පාරෙන් පසුව වෙලමැද නියර          දිගේ
ගුරු ගෙදරට මනිති පියවර නොකර          දිගේ
හුරුවුණ ළමාසාරිය දෑ ඇඳුම          අගේ
දරුකැළ දකුම සිරියාවකි නෙතට          මගේ

පිවිසුම ගුරුපාර ගම ගොඩ මඩ          සරුය
සව්බල ගොවි දෑත ඒ දෙකටම          හුරුය
පන්සල ගමට සැදි මිණි පහණක්          යුරුය
බොදුහෙල සැබිය විය, දන අදමින්          දුරුය

අඩසිය වසරකට පෙර මා දිනුව          ගම
තිබුණේ ඒ ලෙයසි එහි විය සුගැමි          කම
දියුණුව නැමැති සීමාවට ඇඳුන          ඉම
අද ඒ ගම නොමැත, මනැසින් දකිමි          මම

**හල්දුම්මුල්ලේ ඒ. ඇම්. කුලසිංහ**
ක්ලේටන් දකුණ

# පහන් වැට

## "පිනම් ගිලෙමි මම සදහම් ගඟුලැල්ලේ"

මැදියම් රැයක සිතුවිලි මගෙ නටන          විට
සඳරැස් දියෙන් සේ දෙයි මනස          යට
නිදිබර වලාකුළු නෙතඟ පැටලෙනා          විට
හිමියන් පමණි දුන්නේ සිසිල          මට

තන්හා රති රඟ මා සිත          සොලවන්නේ
පමානවා කරන්නද නැහැ මට          තේරෙන්නේ
උමතු වූ මසිත එහෙ මෙහෙ දුව          යන්නේ
මගෙ තනියට හිමි පමණයි දැන          ඉන්නේ

අනෙකුත් සසරෙ මම බෙහෙවින් සැරි          සැරුවේ
තේරුම් ගන්න බැරි විය තතු නියම          ලොවේ
හිමියන් දෙසූ දහමෙ ඇති මහඟු          බවේ
නිවරද වරද පැහැදුනි සිත්          තලාවේ

පුන් පොහොදා වෙසගෙ සල්ගස          සෙවනැල්ලේ
සව් සතහට දුනි සැනසුම          ඉවසිල්ලේ
සත් පියුමක වැඩ කිරණ පෑ පා          රැල්ලේ
පිනම් ගිලෙමි මම සදහම්          ගඟුලැල්ලේ

**ආචාර්ය මාතු ලියනගේ**

# අහිමි ලොවින් හිමි ලොවට

සත් වසරක් ගෙවී ගතවෙන කල          මෙමට
රෝ රකුසාට බිලි වී මවු මැරෙන          විට
මගේ මව නොමැති පාඩුව          පිරිමහන්නට
කුඩම්මා ආවා මගෙ තනි          නොතනියට

ආදර කරුණාව සෙනෙහස මට          පාමින්
මා රැක බලා ගත්තා දුක සැප          බලමින්
එනමුත් කලක් යනවිට කෙමෙන්          කෙමන්
කටුස්සෙක් වගේ විය ඈ වෙනස්          වෙමින්

ඈ වෙස් වලාගත් රුදු රකුසියෙක-          වෙමින්
ගිරයට අසුවූ ගෙඩියක් මෙන් සිර          විමෙන්
ශිංසා පීඩා දුක් කරදර නිතර          දෙමින්
ණපුරු කමින් මා හද තැලුවා          සැනකින්

අසත්‍ය චෝදනාවක් මට නැගූ          විටදී
දිවුරා කිවුවෙමි මා අත නැති          වැරදී
රත් වූ ගිනි සිලක් ගෙන මා පසු          එද්දී
බැද්දට ගොසින් සැඟවුනි ඈගෙන්ද          මිදී

පියා ගෙදර ආ විට ඈ කිවූ          බොරුවෙන්
ඔහු දැඩි කෝපයට පත් වී නපුරු          වෙමින්
ගහෙන් වැටුන විට ගොනෙකු ඇන්න          ලෙසින්
මී හරකෙකුට මෙන් තැලුවා මට          වෛරෙන්

නිදි නොලබා මා දුක සේ          සිටියාය
පියත් කුඩම්මත් සුවසේ          නින්දේය
අහිමි ලොව හැර හිමි ලොව          බැලුවාය
පැල දොරින් මම මිදුලට          බැස්සාය

හසරක් නොදැන මං මුලා වූවෙකු          ලෙසින්
බියෙන් සැලි සැලී වට පිට          බලමින්
තද සීතලේ ඇඟ පත හිරිගඩු          පිපෙමින්
නොදැනුවත්වම පාරකට වැටුනාය          සොවින්

වෙහෙස මහන්සිය කුසගින්නත්          සැරය
තවත් ඉදිරියට යන්නට සවි          නැතිය
අසල ගල් කුලක වී මා ඇන          හිටිය
නිමා නොවන සිතුවිලි හදේ          මතුවීය

ගතවූයේ නිමේශයකි කිසිවකු          ඇවිදින්
මේ රෑ මෙතැන ඉන්නේ ඇයි දැයි          අසමින්
අනුලෝම ප්‍රතිලෝම බැල්මන්          හෙළමින්
ඔහු හා යන්න මට ඇරයුම් කලා          මෙතනින්

ඉබ්බා දියේ වැටුනා සේ          ප්‍රමෝදයෙන්
ඔහු හා සමඟ ගොස් කා බී එහි          නිදමින්
ගෘහපති යුවල මගේ තතු දැන          ගනිමින්
මට එහි නවාතැන් දුන්නා නොසිතූ          ලෙසින්

තම දරුවෙකුට මන් ආදරය          පාමින්
ඔවදන් මෙන්ම සිප් සතරට යොමු          කරමින්
ඇදුරන් පිරුන මගේ දිවි එකලු          කරමින්
වාසනාව ගෙන දුනි සත් ක්‍රියා          දමෙන්

සිප් සත පොවා ගුණ ණැන බල වැඩුන          හෙයින්
අනගි අමිල සේවයෙ ණයගැති          වීමෙන්
දිවි හිමියෙන්ම මගේ මව්පියෝ මෙන්          රකිමින්
මතු භවයේදීත් ඔබලා පතනවා          බැතියෙන්

වනයේ හැම තැනම කලුවර ගස්ද          නැත
පොලවේ හැම තැනම රන් මිනිමුතු ද          නැත
හැම විලකම ස්වර්ණ හංසයන්ද          නැත
හැම මිනිසෙක් ලගම යහ ගුණයන්ද          නැත

**සෙනෙහෙලතා රත්නායක**
ග්ලෙන් වැවර්ලි

# වෙසඟ සිරි වරුණ

ලෝකත්‍රයට තිලෝකයක් වූ          උත්තම
තෙමඟුල සිහිකරයි බැතියෙන්          පිරිසම
ඊර්ෂ්‍යයා ක්‍රෝධ බැඳ හැම          අස්සේම
සැරසිලි සරුව පිත්තල හදයි          රොත්තම

සද්ධාවන්ත හන්දියෙ මුදලාලි          වරු
දන්සැල් ඉදිකරලා වෙස්සන්තර          රජවරු
බෙනස් රටේන් වඩී අනේ පිඬු          සිටුවරු
පදික වේදිකාවේ දී'පාමොක්          ගුරුවරු

අන්න බලන් තොටළඟ රාජයා          තොරණ
සීයක් උසයි පනහක් අඩි          පැතිරෙන
බුදුරැස් විහිදිලා සාධු බබලන          ලස්සන
මුඩුක්කුවේ අපාය නොබලන් පින්ව          ජන

මැති ඇමතුමන් සුදුවත් ඇඳුම්          සැරසී
මල් වට්ටිය පුදයි සඟවා කඩ          කිනිසී
බුද්ධාලම්භන තුටින් ඔදවයි මෙපුර          වැසී
සාධු නඟයි අත් එක්කර තදට          නිසී

**අතුල විජේවික්‍රම**
මැක්ලවුඩ්



# දෙබස්

## දමිත් උදයංග දහනායක

සිනමා හලේ සීතල
නැතිදනා එළියට එනකොටම

තාර පාරේ ඔබ ගියේ
කකුල් පිච්චෙන්න වගේ හරි හදිසියට
තෙහෙට්ටු මූණෙ කම්බුල් හරහට
කොණ්ඩගස් දෙකක් ඇලිල තිබුණ දාඩියට
දිව අගින් පො[illegible]වමින් වේලිච්ච තොල් දෙපට
ඇස් බෝල දිව්ව කලබලෙට
එහෙ මෙහෙට

කිටි කිටියෙ ගැහෙන දෙබස් නැති බස් එකක
හිටි හැටි
නන්නාඳුනන අය වාගේම

පුදුමෙටම
බස් එකේ ගියෙත් ඒ සින්දුවම
ෂාරුක් කාජල්ට කිස් එකක් දෙන තැනම
අපේ ඇස් යාවුනා මොහොතකට

හිනාවක් තුනී කරගෙන
හීනියට
මුළු මූණටම
ඔබේ ඇස් බැල්ම වැටුනා ආයිමත් පහතටම

# නුඹ ඇවිත් තිබුණා

සියලු පත් අතහැර
තුරු පෙළ හරින මොහොතක
සුළ[illegible]ද මිදී ගල්වුණා
සිසිරයේ ඉම දවසක
හද මැදම, උණුසුම්
කුටියක් තනා රහසේම
නුඹ ඇවිත් තිබුණා
එන යන බවක් නොකියාම

කහ මලින් පලසක්
තණබිම එලන දවසක
සැඩ හිරුට නතුවී
මුළු ලොව දැවෙන භවසක
සිත ළ[illegible]ම, සිසිලස
පහසක් වෙලා රහසේම
නුඹ ඇවිත් තිබුණා
නවතින බවක් නොකියාම

**මලිති විජේසේකර**

# මාතු පාදං නමාමී

**මව්වරුන්ගේ දිනය වෙනුවෙන්....**

දස මසක් මා කුස දරගෙන
අනේක දුක් විඳ මොලොව බිහිකර
මා හැදූ වැඩූ මව්නි දයාබර
ඔබේ දෙපා නමදිමි බැතින්

හොඳ නම විතර වටිනා කිසිවක්
ලඳකට හිමි නැති වග මෙතුවක්
නොමඳව දෙමින් යහ ගුණ පිරි ඔවදන්
මව්නි ඔබේ දෙපා නමදිමි පෙමින්

පියකරු මුදු වචන නිබඳව තෙපලීම
වැඩිහිටියනට ගරු කටයුතු සැලකීම
කල වරදට සමාව දී සැනසීම
උතුම් සත් ගුණ බැව් ලඳකට උරුම

මගේ දිවි රැකුනෙ ඔබ දුන් කිරි බිඳුවෙන්
මා වැටුනු විට සුරතින් මා නැගුටුවාලමින්
සෙවනැල්ලක්ව මා පසුපස රැඳෙමින්
දිගුකල් ජීවත් වනු මැන මව්නි මා ආයුද විඳිමින්

**සුභාෂිනී බුද්ධසිරි**
බෙරික්